# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1789/19 - 2012 දෙසැම්බර් මස 18 වැනි අඟහරුවාදා - 2012.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

සිල්ලර හා තොග වෙළෙඳ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ සිල්ලර හා තොග වෙළෙඳ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ, ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013.01.01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

සිල්ලර හා තොග වෙළෙඳ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1990 පෙබරවාරි මස 28 වැනි දින අංක 599/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනයෙහි වූ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2010 අගෝස්තු මස 27 වැනි දින අංක 1668/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ වූ නිවේදනය මගින් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් නව කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

II වැනි කොටස

*මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය*

I වැනි තීරය

*සේවකයන්ගේ පංතිය*

| | |
|---|---|
| *I ශ්‍රේණිය* | ගබඩාකරුවන්, පොත් තබන්නන්, අයකැමිවරුන්, කළමණාකරුවන්, ලඝුලේඛකයින්, ඩිස්පැන්සර්වරුන් |
| *II ශ්‍රේණිය* | දුරකථන ක්‍රියාකරුවන්, ලිපිකරුවන්, යතුරු ලේඛකයින්, ලෙජර් ලිපිකරුවන්, ගිණුම් ලිපිකරුවන්, සහකාර අයකැමිවරුන්, පිරිවැය ලිපිකරුවන්, වේතන ලිපිකරුවන්, මුදල් යන්ත්‍ර ක්‍රියාකරුවන්, බිල් ලිපිකරුවන් |
| *III ශ්‍රේණිය* | බිල්පත් එකතු කරන්නන්, විකුණුම්කරුවෝ, විකුණුම්කාරියෝ, හරි වැරදි බලන්නන් |
| *IV ශ්‍රේණිය* | කම්කරුවන්, බඩු බාහිරාදිය බෙදන ළමුන්, සාප්පු සේවකයින්, අසුරන්නන්, පණිවුඩකරුවන්, කවුන්ටර් සේවකයින්, ඕඩර්ලිවරුන්, බෑමේ සහ පැටවීමේ කම්කරුවන්, පොම්පකරුවන්, පාපැදිකරුවන් |

1A - G 17037 — 1,110 (2012/12)

II වැනි තීරය

*මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය*

සේවක පංතිය

| *සේවා වර්ෂය* | *I ශ්‍රේණිය රු. ශ.* | *II ශ්‍රේණිය රු. ශ.* | *III ශ්‍රේණිය රු. ශ.* | *IV ශ්‍රේණිය රු. ශ.* |
|---|---|---|---|---|
| 1 වසර | 10,610 00 | 10,060 00 | 9,515 00 | 8,970 00 |
| 2 වසර | 10,785 00 | 10,210 00 | 9,640 00 | 9,070 00 |
| 3 වසර | 10,960 00 | 10,360 00 | 9,765 00 | 9,170 00 |
| 4 වසර | 11,135 00 | 10,510 00 | 9,890 00 | 9,270 00 |
| 5 වසර | 11,310 00 | 10,660 00 | 10,015 00 | 9,370 00 |
| 6 වසර | 11,485 00 | 10,810 00 | 10,140 00 | |
| 7 වසර | 11,660 00 | 10,960 00 | 10,265 00 | |
| 8 වසර | 11,835 00 | 11,110 00 | 10,390 00 | |
| 9 වසර | 12,010 00 | 11,260 00 | 10,515 00 | |
| 10 වසර | 12,185 00 | 11,410 00 | 10,640 00 | |

01- 65/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

මුද්‍රණ කර්මාන්තය

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ මුද්‍රණ කර්මාන්තය විසින් ඇති කරන ලදුව, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති තීරණ, ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව, එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013.07.07 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

මුද්‍රණ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1945 ජූලි මස 21 වැනි දින අංක 9436 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබුවා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද සහ අවසන් වරට 2010 ජූනි මස 30 වන දින අංක 1660/35 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම් වලින් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*II වැනි කොටස*

*කම්කරුවන්ගේ පංතිය*

*"ඒ" පංතියේ කම්කරුවන් :*

ප්‍රොසෙස් ආට්ස්වරු, ප්‍රොසෙස් කැමරා ඔපරේටර්වරු, ප්‍රොසෙස් එචර්වරු, ප්‍රොසෙස් හැන්ඩ්ස් ලිතෝ ආට්ස්වරු, ලිතෝ සහ ඕෆ්සෙට් මැෂින් මයින්ඩර්වරු, රොටරි මැෂින් මයින්ඩර්වරු, පොටෝග්‍රැෆර් හා රොටාග්‍රැනෝ මැෂින් මයින්ඩර්වරු, ටින් ප්ලේට් පින්ටර්වරු, ෆිල්ම් සෙටර්වරු, ලයිනෝටයිප් ඔපරේටර්වරු, මොනෝ ටයිප් කී බෝඩ් ඔපරේටර්වරු, ලඩ්ලෝ ඔපරේටර්වරු, ලයිනෝ ටයිප් මිකැනික්වරු, මුද්‍රණ යන්ත්‍ර මිකැනික්වරු, ප්‍රොසෙස් එන් ගෙවර්වරු සහ මවුන්ටර්වරු, ප්‍රොසෙස් ප්‍රින්ටර් ඩ්වුන්වරු, ලිතෝ ට්‍රාන්ස්පර්වරු, ලිතෝ පෲෆ්වර්වරු මවුන් ශෝධ්‍ය පත්‍ර කියවන්නෝ (පුවත්පත් නිෂ්පාදනයේ නියුක්ත වූවන් හැර)

"බී" පංතියේ කම්කරුවන් :

මොනෝ ටයිප් කාස්ටර් යන්ත්‍ර ක්‍රියාකරවන්නන් (ඇටෙන්ඩර්වරු) සුපර් කාස්ටර් යන්ත්‍ර ඇටෙන්ඩර්වරු, එල්රොඩ් මැෂින් ඔපරේටර්වරු, වර්ණ යෝජකයෝ, ස්ටෝන් හැන්ඩ්වරු සහ ඉම්පෝසිං හැන්ඩ්වරු, ප්‍රෙස්මන්වරු, ලෙටර් ප්‍රෙස් සිලින්ඩර් මැෂින් මයින්ඩර්වරු සහ පෝෂකවරු, සිල්ක් ස්ක්‍රීන් මැෂින් ඔපරේටර්වරු, රබර් මුද්‍රා සාදන්නෝ, රිලීෆ් ස්ටැම්ප්වරු සහ ඩයිප්ස්ටැම්ප් මැෂින් ඔපරේටර්වරු, බයින්ඩර්වරු, බයිංඩිං මැෂින් ඔපරේටර්වරු, මසන යන්ත්‍ර ඔපරේටර්වරු, නවන යන්ත්‍ර ඔපරේටර්වරු, කාටුන් කැපීමේ සහ ඇලවීමේ මැෂින් ඔපරේටර්වරු, කපන්නෝ (අතින් සහ යන්ත්‍රයෙන්), ගිලටින් මැෂින් ඔපරේටර්වරු සහ ගිල්ඩර්වරු, රූල් ගසන්නෝ (අතින් සහ යන්ත්‍රයෙන්) ස්ටීරියෝ ටයිප්වරු, මැන්ගල්වරු, පවුන්ඩ්‍රිමන්වරු, පවුන්ඩර් තහඩුවත්කරන්නෝ, අකුරුවත් කරන්නෝ, ප්ලේටින් මැෂින් මයින්ඩර්වරු (සම්පූර්ණ ස්වයංක්‍රියාකාරී යන්ත්‍ර ක්‍රියාකරුවන්), රෝලර් වත් කරන්නෝ (රෝල් වත්කිරීමේ තුවක්කුව පාවිච්චි කිරීමෙන්), ප්ලේටින් මැෂින් මයින්ඩර්වරු (හැන්ඩ් ෆීඩ්), රෝලර් වත් කරන්නෝ (අතින්)

*"සී" පංතියේ කම්කරුවන් :*

ෆවුන්ඩර් ප්ලේට් විපර්වරු, ෆවුන්ඩ්රි කම්කරුවෝ, රෝටර් කම්කරුවෝ, අසුරන්නෝ, ගණන් කරන්නෝ සහ හරි වැරදි බලන්නෝ -

"ඩී" පංතියේ කම්කරුවන් - වයස අවුරුදු 18ට නොඅඩු නුපුහුණු කම්කරුවෝ

"ඊ" පංතියේ කම්කරුවන් - වයස අවුරුදු 18ට නොඅඩු නුපුහුණු කම්කරුවෝ

"එෆ් "පංතියේ කම්කරුවන් - මුරකරුවෝ

**වැඩ ඉගෙන ගන්නන් හා වැඩ පුහුණුවන්නන් නොවූ කම්කරුවන්ට මාස සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| *සේවා වසර* | *"ඒ" පංතිය* රු. ශ | *"බී" පංතිය* රු. ශ | *"සී" පංතිය* රු. ශ. | *"ඩී සහ "එෆ්" පංතිය* රු. ශ. | *"ඊ" පංතිය* රු. ශ. |
|---|---|---|---|---|---|
| 1 වසර | 10,530 00 | 10,140 00 | 9,750 00 | 9,360 00 | 8,970 00 |
| 2 වසර | 10,730 00 | 10,315 00 | 9,900 00 | 9,485 00 | 9,070 00 |
| 3 වසර | 10,930 00 | 10,490 00 | 10,050 00 | 9,610 00 | 9,170 00 |
| 4 වසර | 11,130 00 | 10,665 00 | 10,200 00 | 9,735 00 | 9,270 00 |
| 5 වසර | 11,330 00 | 10,840 00 | 10,350 00 | 9,860 00 | 9,370 00 |
| 6 වසර | 11,530 00 | 11,015 00 | 10,500 00 | 9,985 00 | 9,470 00 |
| 7 වසර | 11,730 00 | 11,190 00 | 10,650 00 | 10,110 00 | 9,570 00 |
| 8 වසර | 11,930 00 | 11,365 00 | 10,800 00 | 10,235 00 | 9,670 00 |
| 9 වසර | 12,130 00 | 11,540 00 | 10,950 00 | 10,360 00 | 9,770 00 |
| 10 වසර | 12,330 00 | 11,715 00 | 11,100 00 | 10,485 00 | 9,870 00 |
| 11 වසර | 12,530 00 | 11,890 00 | 11,250 00 | 10,610 00 | 9,970 00 |
| 12 වසර | 12,730 00 | 12,065 00 | 11,400 00 | 10,735 00 | 10,070 00 |
| 13 වසර | 12,930 00 | 12,240 00 | 11,550 00 | 10,860 00 | 10,170 00 |
| 14 වසර | 13,130 00 | 12,415 00 | 11,700 00 | 10,985 00 | 10,270 00 |
| 15 වසර | 13,330 00 | 12,590 00 | 11,850 00 | 11,110 00 | 10,370 00 |

වැඩ ඉගෙන ගන්නෝ හා වැඩ පුහුණුවන්නෝ

| සේවා වසර | "ඒ" පංතිය<br>රු. ශ. | "බී" පංතිය<br>රු. ශ. | "සී" පංතිය<br>රු. ශ. |
|---|---|---|---|
| 1 වසර | 8,000 00 | 7,730 00 | 7,450 00 |
| 2 වසර | 8,150 00 | 7,855 00 | 7,550 00 |
| 3 වසර | 8,300 00 | 7,980 00 | 7,650 00 |
| 4 වසර | 8,450 00 | 8,105 00 | 7,750 00 |
| 5 වසර | 8,600 00 | 8,230 00 | 7,850 00 |

01-65/2

---

**පඩිපාලක සභා ආඥාපනත**

බීඩි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ බීඩි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 ජනවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

බීඩි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1957ක් වූ නොවැම්බර් මස 29 වැනි දින අංක 11208 දරන *අති විශෙෂ ගැසට් පත්‍ර* නිවේදනයෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන්වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද දැන්වීම්වලින් වෙනස් කරන ලද්දාවූ ද, තීරණ එම උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත දැක්වෙන කොටස් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*II වැනි කොටස*

*කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණයන්*

(බීඩි එතීම සඳහා කැපූ එතුම් කොළ සුදානම් කිරීම, ඔතන කොළ කැපීම, ඔතන කොළ තැබීම, කැපූ එතුම් කොළ " බීඩි දුම්කොළ " වලින් පිරවීම, බීඩි එතීම සහ එතූ බීඩි බැඳීම ඇතුළුව) බීඩි එතීම සඳහා කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණයන් :

| | | | රු. ශ. |
|---|---|---|---|
| (අ) | දිග අඟල් 2 ට නොවැඩි බීඩි 1,000ක් සඳහා | - | 310 00 |
| (ආ) | දිග අඟල් 2 ට වැඩි එහෙත් අඟල් 3ට අඩු බීඩි 1,000ක් සඳහා | - | 350 00 |
| (ඇ) | දිග අඟල් 3 ට නොඅඩු බීඩි 1,000ක් සඳහා | - | 385 00 |

(කැපූ එතුම් කොළ " බීඩි දුම්කොළ" වලින් පිරවීම, බීඩි එතීම සහ එතූ බීඩි බැඳීම ද ඇතුලුව එහෙත් බීඩි එතීම සඳහා කැපූ එතුම් කොළ පිළියෙල කිරීම සහ ඔතන කොළ කැපීම හැර) බීඩි එතීම සඳහා කෑලි ගණනේ වැඩ වලට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන් :

| | | | |
|---|---|---|---|
| (අ) | දිග අඟල් 2 ට නොවැඩි බීඩි 1,000ක් සඳහා | - | 235 00 |
| (ආ) | දිග අඟල් 2 ට වැඩි එහෙත් අඟල් 3ට අඩු බීඩි 1,000ක් සඳහා | - | 263 00 |
| (ඇ) | දිග අඟල් 3 ට නොඅඩු බීඩි 1,000ක් සඳහා | - | 290 00 |

(බීඩි එතීම සඳහා කැපූ එතුම් කොළ පිළියෙළ කිරීමද, අතුළුව) ඔතන කොළ කැපීම සඳහා කෑලි ගණනේ වැඩ වලට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන් :

| | | | |
|---|---|---|---|
| (අ) | දිග අඟල් 2 ට නොවැඩි බීඩි 1,000ක් සඳහා | - | 156 00 |
| (ආ) | දිග අඟල් 2 ට වැඩි එහෙත් අඟල් 3ට අඩු බීඩි 1000ක් සඳහා | - | 168 00 |
| (ඇ) | දිග අඟල් 3 ට නොඅඩු බීඩි 1000ක් සඳහා | - | 182 00 |

එතූ බීඩි වටා ලේබල් සවිකිරීම සඳහා කෑලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අඩුම වැටුප් ප්‍රමාණය බීඩි 1000ට රු. 40.00ක් විය යුතු ය.

01-65/3

---

**පඩිපාලක සභා ආඥාපනත**

ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, මෙම උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013.01.01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, 1961 අගෝස්තු මස 25 වැනි දින අංක 12617 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට 2010 ජුනි මස 30 දින අංක 1660/35 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ තීරණ, එම උපලේඛනයෙහි II වන කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*II වන කොටස*

ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තයේ නියුක්ත සේවක පන්තිවලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය සහ අවම මාසික වේතන ප්‍රමාණය පහතින් දක්වා ඇත.

**සේවකයින්ගේ පන්තිය**

*පුහුණු කම්කරුවෝ I වැනි ශ්‍රේණිය :*

ප්‍රෙස් යන්ත්‍රයට මැටි සපයන්නෝ (යන්ත්‍රයෙන් ), පෝරණුවලට ගින්දර දමන්නෝ (දාහකයෙන්)

*පුහුණු කම්කරුවෝ II වැනි ශ්‍රේණිය :*

ප්‍රෙස් යන්ත්‍රයට මැටි සපයන්නෝ (අතින් ), පිළිස්සීම සඳහා පෝරණුව තුළ උළු පැටවීමේ සහ කඳු ගැසීමේ යෙදෙන්නෝ, තෝරා වෙන්කරන්නෝ

*අර්ධ පුහුණු කම්කරුවෝ :*

දබර කරකවන්නෝ, කට්ටි කපන්නෝ, උළු කට්ටවලට තෙල් ගාන්නෝ සහ මට්ටම් කරන්නෝ, සාහින්නෝ, අමු උළු තෝරා වෙන් කරන්නෝ, ගෙනයාම සඳහා උළු වාහනවලට ගොඩ ගසන්නෝ

*නුපුහුණු කම්කරුවෝ :*

මැටි කලවම් කිරීමේ සහ පැහීමේ යෙදී සිටින කම්කරුවෝ, ට්‍රක් පුරවන්නෝ, මැටි කරුවෝ, කට්ටි ගෙනයන්නෝ, යන්ත්‍රයෙන් මිශ්‍ර කිරීමේ දී හා අත් ගැසීමේ යෙදී සිටින කම්කරුවෝ, රාක්කවලට උළු ගොඩගැසීමේ යෙදී සිටින කම්කරුවෝ, උළු හිරු රැසින් වේලීමේ යෙදී සිටින කම්කරුවෝ, උළු තෝරා වෙන්කරන්නන්ගේ අත් උදව්කරුවෝ, අමු උළු තෝරා වෙන්කරන්නන්ගේ අත් උදව්කරුවෝ, දර අදින්නෝ, අත් ගසන යන්ත්‍රයට මැටි සපයන්නෝ, උළු කඳු ගසන්නෝ, ප්‍රෙස් යන්ත්‍රවලට හෝ ගබඩාවේ අනෙක් කොටස්වලට මැටි කට්ට ගෙන යන්නෝ, පිළිස්සීම සඳහා පෝරණුව තුළ උළු පැටවීමෙහි සහ කඳු ගැසීමෙහි යෙදෙන්නන්ගේ අත් උදව්කරුවෝ.

අවම දෛනික වේතන ප්‍රමාණය

| *I තීරය* *සේවකයාගේ පන්තිය* | *II තීරය* *ප්‍රමාණය* *රු. ශ.* |
|---|---|
| පුහුණු කම්කරුවෝ I ශ්‍රේණිය | 412 50 |
| පුහුණු කම්කරුවෝ II ශ්‍රේණිය | 390 00 |
| අර්ධ පුහුණු කම්කරුවෝ | 367 50 |
| නුපුහුණු කම්කරුවෝ | 345 00 |

අවම මාසික වේතන ප්‍රමාණය

| *සේවකයාගේ පංතිය* | *1 වසර* *රු. ශ.* | *2 වසර* *රු. ශ.* | *3 වසර* *රු. ශ.* | *4 වසර* *රු. ශ.* | *5 වසර* *රු. ශ.* |
|---|---|---|---|---|---|
| පුහුණු කම්කරුවෝ I ශ්‍රේණිය | 10,312 50 | 10,487 50 | 10,662 50 | 10,837 50 | 11,012 50 |
| පුහුණු කම්කරුවෝ II ශ්‍රේණිය | 9,750 00 | 9,900 00 | 10,050 00 | 10,200 00 | 10,350 00 |
| අර්ධ පුහුණු කම්කරුවෝ | 9,187 50 | 9,312 50 | 9,437 50 | 9,562 50 | 9,687 50 |
| නුපුහුණු කම්කරුවෝ | 8,625 00 | 8,725 00 | 8,825 00 | 8,925 00 | 9,025 00 |

01-65/4

**පඩිපාලක සභා ආඥාපනත**

සිනමා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ සිනමා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති තීරණ, ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 ජනවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

සිනමා කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව විසින් ඇති කරන ලදුව 1949 මාර්තු මස 30 වැනි දින අංක 9961 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූවා වූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරනු ලැබූ සහ අවසන් වරට 2010 ජූනි මස 30 දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද තීරණ, එම උපලේඛනයේ I වන කොටස වෙනුවට පහත සඳහන් I කොටසෙන් දැක්වෙන සේවකයින්ගේ පන්තිය හා II සටහනෙන් දැක්වෙන අදාළ අවම මාසික වේතනය ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතු ය.

*I වන කොටස*

සිනමා කර්මාන්තයේ නියුක්ත පහත සේවක පන්ති වලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ වන අවම මාසික වේතන ප්‍රමාණය පිළිවෙලින් මහ නගර සීමාව තුළ සිනමා ශාලාවන්ට සහ මහ නගර සීමාවෙන් පිටත සිනමා ශාලාවන්ට අදාළ වන පරිදි I වගුවෙන් සහ II වගුවෙන් දක්වා ඇත.

**සේවක පන්තිය**

*"ඒ" ලිපිකාර නොවන*

***නුපුහුණු***

ප්‍රසිද්ධ කිරීමේ කරත්ත අදින්නා, ප්‍රසිද්ධ කිරීමේ හෝ පෝස්ටර් පත්‍රකාරයා, නාන කාමර සේවක, කාර් හෝ බයිසිකල් නැවතුම්පොළ සේවක, චොකලට්කාරයා, ක්ලීනර්, ක්ලෝක්රූම් සේවකයා, කසල ශෝධකයා, තෝට කාරයා, ගේට්ටුකාරයා, පියුන්, සැන්ඩ්විච්කාරයා, (චිත්‍රපටි) ශාලා සේවකයා, සිසිල්බීම කාරයා, ප්‍රගුණ නොවූ කම්කරුවා, අසුන් පෙන්වන්නා, අසුන් පෙන්වන්නී, වේටර්, කාවල්කාරයා (දවල්), කාවල්කාරයා (රාත්‍රී)

***අර්ධ පුහුණු***

සහකාර බාර් කීපර්, සහකාර ඇන්ජින් ඩ්‍රයිවර්, චෙකර්, කෝකි II ශ්‍රේණිය (පහළ), රිවයින්ඩර්, ටෙලිෆෝන් ඔපරේටර්, තුන්වන සහකාර ඔපරේටර්

***පුහුණු II ශ්‍රේණිය***

සහකාර ඔපරේටර්, බාර් කීපර්, වඩු කෝකි I ශ්‍රේණිය (ඉහළ) විදුලි කාර්මික II ශ්‍රේණිය, චිත්‍රපටි කාමරය අලුත්වැඩියා කරන්නා II ශ්‍රේණිය, නොන්සිංච් ඔපරේටර්, දෙවන සහකාර ඔපරේටර්, පරිපාලන හෝ ප්‍රධාන චෙකර්, කුඩාරම් පාලක, වයර් මෑන්, ෆයර් මෑන්

*පුහුණු I ශ්‍රේණිය*

ප්‍රධාන ඔපරේටර් (I ශ්‍රේණිය ), ආම්චර් ඔතන්නා, විදුලි කාර්මිකයා (I ශ්‍රේණිය) ඇන්ජින් ඩ්‍රයිවර්, චිත්‍රපටි කාමර අලුත්වැඩියා කරන්නා (I ශ්‍රේණිය), කූඩාරම් සවිකරන්නා.

"බී" ලිපිකාර

*III ශ්‍රේණිය*

ප්‍රසිද්ධ කරන ලිපිකරු, සහකාර මුදල් භාර ලිපිකරු, යවන හා ඉවත් කරන ලිපිකරු, කලින් ආසන වෙන් කරන ලිපිකරු, ආසන වෙන් කරන ලිපිකරු

*II ශ්‍රේණිය*

ප්‍රසිද්ධ කරන කළමනාකාර, මුදල් භාර ලිපිකරු, ලිපිකරු (ගිණුම් හා සාමාන්‍ය ), ටයිප් කරන්නා, වාප්පු ලිපිකරු, ගබඩාකරු, ගණන් තබන්නා

*I ශ්‍රේණිය*

ප්‍රධාන ලිපිකරු

*අනෙක් අය*

කළමනාකරු, සහකාර කළමනාකරු

I වගුව

මහ නගර සීමාව තුළ

| | අවම මාසික වේතනය සේවා වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| *සේවක පන්තිය* | *1 වන වසර* | *2 වන වසර* | *3 වන වසර* | *4 වන වසර* | *5 වන වසර* |
| *"ඒ " ලිපිකාර නොවන* | *රු. ශ.* | *රු. ශ* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| නුපුහුණු | 8,850 00 | 8,950 00 | 9,050 00 | 9,150 00 | 9,250 00 |
| අර්ධ පුහුණු | 9,220 00 | 9,345 00 | 9,470 00 | 9,595 00 | 9,720 00 |
| පුහුණු II ශ්‍රේණිය | 9,740 00 | 9,890 00 | 10,040 00 | 10,190 00 | 10,340 00 |
| පුහුණු I ශ්‍රේණිය | 10,625 00 | 10,800 00 | 10,975 00 | 11,150 00 | 11,325 00 |
| *"බී" ලිපිකාර* | | | | | |
| III ශ්‍රේණිය | 9,220 00 | 9,345 00 | 9,470 00 | 9,595 00 | 9,720 00 |
| II ශ්‍රේණිය | 9,710 00 | 9,860 00 | 10,010 00 | 10,160 00 | 10,310 00 |
| *I ශ්‍රේණිය* ප්‍රධාන ලිපිකාර | 10,325 00 | 10,500 00 | 10,675 00 | 10,850 00 | 11,025 00 |
| *අනෙක් අය* | | | | | |
| කළමණාකරු | 10,990 00 | 11,165 00 | 11,340 00 | 11,515 00 | 11,690 00 |
| සහකාර කළමණාකරු | 9,600 00 | 9,750 00 | 9,900 00 | 10,050 00 | 10,200 00 |

II වගුව

මහ නගර සීමාවෙන් පිටත

| සේවක පන්තිය | අවම මාසික වේතනය සේවා වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 1 වන වසර | 2 වන වසර | 3 වන වසර | 4 වන වසර | 5 වන වසර |
| "ඒ " ලිපිකාර නොවන | රු. ශ. | රු. ශ | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| නුපුහුණු | 8,925 00 | 9,025 00 | 9,125 00 | 9,225 00 | 9,325 00 |
| අර්ධ පුහුණු | 9,295 00 | 9,420 00 | 9,545 00 | 9,670 00 | 9,795 00 |
| පුහුණු II ශ්‍රේණිය | 9,810 00 | 9,960 00 | 10,110 00 | 10,260 00 | 10,410 00 |
| පුහුණු I ශ්‍රේණිය | 10,695 00 | 10,870 00 | 11,045 00 | 11,220 00 | 11,395 00 |
| "බී" ලිපිකාර | | | | | |
| III ශ්‍රේණිය | 9,295 00 | 9,420 00 | 9,545 00 | 9,670 00 | 9,795 00 |
| II ශ්‍රේණිය | 9,295 00 | 9,445 00 | 9,595 00 | 9,745 00 | 9,895 00 |
| I ශ්‍රේණිය | | | | | |
| ප්‍රධාන ලිපිකාර | 10,135 00 | 10,310 00 | 10,485 00 | 10,660 00 | 10,835 00 |
| අනෙක් අය | | | | | |
| කළමණාකරු | 10,805 00 | 10,980 00 | 11,155 00 | 11,330 00 | 11,505 00 |
| සහකාර කළමණාකරු | 9,375 00 | 9,525 00 | 9,675 00 | 9,825 00 | 9,975 00 |

01- 65/5

---

**පඩිපාලක සභා ආඥාපනත**

රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 ජනවාරි මස 01 වැනි දිනට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1945ක් වූ ජූලි මස 21 වැනි දින අංක 9436 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළවූ නිවේදනයෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කලට වෙනස් කරන ලද්දාවූ ද, අවසන්වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයෙහි II වන කොටස වෙනුවට පහත සඳහන් නව කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*II* **වන කොටස**

*මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය*

**සේවක පන්තිය**

*II වැනි ශ්‍රේණිය :*

ෂීට් ගැලවීම, පලුදු කපා දැමීම හා බාක් කැපීම, පුස්කාපු රබර් සේදීම හා නැවත දුම් ගැස්සීම, පැස් වලටත්, තරාදිවලටත්, ගබඩාවේ වෙනත් තැන් වලටත් ගෙනයාම ඇතුලුව කම්කරුවන් කරන සාමාන්‍ය වැඩ, ගොඩ ගැසීම, බේල් කිරීම සඳහා රබර් කුත්තු කිරීම සහ එතීම පැසේ දමා තද කිරීම, වලයන් වලින් හා කම්බි වලින් බැඳීම, ජුටෙසින් කවර කැපීම, පින්තාරු කිරීම, වේලීම, ගොඩගැසීම, ලකුණු කිරීම, විශේෂ ඇහිරීම සඳහා ජුටෙසින්වල හුණු ගෑම, රබර් බේල් ජුටෙසින්වලින් ඔතා මැහුම් දැමීම, මිටි බිම දැමීම, ගබඩා සහ කාණු පිරිසිදු කිරීම හා පිස දැමීම යන මේවායේ නිරත කම්කරුවෝ,

*මධ්‍යම ශ්‍රේණිය :*

කිරීම, වර්ග කිරීම හා තේරීම, ප්‍රෙස් ක්‍රියා කරවීමේ වැඩ යන මේවායේ නිරත කම්කරුවෝ

*I වැනි ශ්‍රේණිය :*

පැටවීම, බෑම හා මිටි ගෙන යාම, අඩුක්කු කිරීමෙහි නිරත කම්කරුවෝ සහ තේරීමේ නිරත කම්කරුවෝ

*මුරකරුවන්*

| *වසර* | *II වැනි ශ්‍රේණිය රු. ශ* | *මධ්‍යම ශ්‍රේණිය රු. ශ* | *1 වැනි ශ්‍රේණිය රු. ශ* | *මුරකරුවන් රු, ශ* |
|---|---|---|---|---|
| 1 වසර | 8,970 00 | 9,360 00 | 9,750 00 | 8,970 00 |
| 2 වසර | 9,070 00 | 9,485 00 | 9,900 00 | 9,070 00 |
| 3 වසර | 9,170 00 | 9,610 00 | 10,050 00 | 9,170 00 |
| 4 වසර | 9,270 00 | 9,735 00 | 10,200 00 | 9,270 00 |
| 5 වසර | 9,370 00 | 9,860 00 | 10,350 00 | 9,370 00 |
| 6 වසර | 9,470 00 | 9,985 00 | 10,500 00 | 9,470 00 |
| 7 වසර | 9,570 00 | 10,110 00 | 10,650 00 | 9,570 00 |
| 8 වසර | 9,670 00 | 10,235 00 | 10,800 00 | 9,670 00 |
| 9 වසර | 9,770 00 | 10,360 00 | 10,950 00 | 9,770 00 |
| 10 වසර | 9,870 00 | 10,485 00 | 11,100 00 | 9,870 00 |
| 11 වසර | 9,970 00 | 10,610 00 | 11,250 00 | 9,970 00 |
| 12 වසර | 10,070 00 | 10,735 00 | 11,400 00 | 10,070 00 |
| 13 වසර | 10,170 00 | 10,860 00 | 11,550 00 | 10,170 00 |
| 14 වසර | 10,270 00 | 10,985 00 | 11,700 00 | 10,270 00 |
| 15 වසර | 10,370 00 | 11,110 00 | 11,850 00 | 10,370 00 |

01-65/6

**පඩිපාලක සභා ආඥාපනත**

විස්කෝතු හා රසකැවිලි (චොක්ලට් සෑදීම ඇතුළුව ) සෑදීමේ කර්මාන්තය

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥා පනතේ 30 වැනි වගන්තියෙන් විස්කෝතු හා රසකැවිලි (චොකලට් සෑදීම ඇතුළුව) සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව මෙහි වූ උපලේඛණයේ නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 ජනවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

විස්කෝතු හා රසකැවිලි (චොක්ලට් සෑදීම ඇතුළුව) සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1968ක් වූ ජුනි මස 14 වැනි දින අංක 14806 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයේ දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද හා අවසන්වරට 2010 ජුනි මස 30 දින අංක 1660/35 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතු ය.

II කොටස

විස්කෝතු හා රසකැවිලි (චොක්ලට් සෑදීම ඇතුළුව ) සෑදීමේ කර්මාන්තයේ නියුක්ත පහතින් දක්වා ඇති සේවක පන්තිවලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම මාසික වේතන ප්‍රමාණයන් පිළිවෙලින් යන්ත්‍රානුසාරයෙන් වැඩ කරන කර්මාන්ත ශාලාවන්ට සහ අතින් වැඩ කරන කර්මාන්ත ශාලාවන්ට අදාළ වන පරිදි පිළිවෙලින් I වගුවෙන් සහ II වගුවෙන් දක්වා ඇත.

***සේවක පන්ති***

*"ඒ " ශ්‍රේණියේ කම්කරුවෝ (පුහුණු)*

*(අ) විස්කෝතු සෑදීම :*

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ ;*

පදම් පිටි අනන බාල්දි සහ භාජන පිරිසිදු කිරීම ඇතුළුව, අවශ්‍ය ද්‍රව්‍ය කිරා බැලීම හා මැනීම, රසායන ද්‍රව්‍ය මිශ්‍රකිරීම, සාර වර්ග හා පාට වර්ග දැමීම හා මිශ්‍රණ යන්ත්‍රවලට ද්‍රව්‍ය පිරවීම ඇතුළුව පදම් පිටි ඇනීම සම්බන්ධ කාර්යයන් කපන යන්ත්‍රය සම්බන්ධ කාර්යයන්, කැපීමේ හා තෙරපීමේ කටයුතු සම්බන්ධ කාර්යයන්, පෝරණුවලට තැටි දමන්නන්ගේ හා පෝරණු සහායකවරුන්ගේ කාර්යයන් ඇතුලුව විස්කෝතු පිච්චීම, අච්චි ගැසීම යන්ත්‍ර සම්බන්ධ කාර්යයන්.

*(ආ) රසකැවිලි සෑදීම* :

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ :*

අවශ්‍ය ද්‍රව්‍යයන් උණු කිරීම, "හොට් ටේබල්ස් " වලින් "බැච්" නොහොත් කැටි කළ මිශ්‍රණය එහා මෙහා මාරු කිරීම සම්බන්ධ කාර්යයන් "කූල් " ටේබල්ස් වලින් "බැච්" නොහොත් කැටි කළ මිශ්‍රණය එහා මෙහා මාරුකිරීම සම්බන්ධ කාර්යයන් "බැච්ෆීඩර්" යන්ත්‍ර

සම්බන්ධ කාර්යයන් “බැච්” නොහොත් කැටි කළ මිශ්‍රණය බන්දේසිවලට හිස් කිරීම සම්බන්ධ කර්යයන් “කපන සහ ඔතන යන්ත්‍රය” සම්බන්ධ කාර්යයන් “ටැබ්ලටිං යන්ත්‍රය” සම්බන්ධ කාර්යයන් “සෙන්ටර් මැනුෆැක්චරිං යන්ත්‍රය” හා සම්බන්ධ කාර්යයන් “කැටකරන යන්ත්‍රය” සම්බන්ධ කාර්යයන්, සාර වර්ග, සීනි සහ පාට වර්ග යෙදීම ඇතුළු දෝළන කැටි හා සම්බන්ධ කාර්යයන් නෙරවීමේ යන්ත්‍රය සම්බන්ධ කාර්යයන්, හැලීමේ යන්ත්‍රය සම්බන්ධ කාර්යයන්, කොකෝ ඇට ශුද්ධ කිරීම හා බැදීම, "පාහින යන්ත්‍රය" ට බදින ලද කොකෝ ඇට දැමීම, "තෙම්පරාදු කරන යන්ත්‍රය", "මණ්ඩි තැන්පත් කරන යන්ත්‍රය" සම්බන්ධ කාර්යයන් ගැස්සෙන මේසය (වයිබ්රේටින් ටේබල්) හා "ශීතකරණ නලය" සම්බන්ධ කාර්යයන්

*“බී” ශ්‍රේණියේ කම්කරුවෝ (අර්ධ පුහුණු)*

*(අ) විස්කෝතු සෑදීම :*

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ :-*

පිටි සහ සීනි, මාජරින්, එළවළු තෙල්, ග්ලූකෝස් ලෙසිටයින්, සාර වර්ග, කොකෝවා, පිටි, චීස්, මෝල්ට්, මිල්ක් පවුඩර්, රසායන ද්‍රව්‍ය, බටර්, ඇමෝනියා, බේකිං පවුඩර්, බිත්තර හා වෙනත් ද්‍රව්‍යයන් බාරගැනීම හා ගබඩා කිරීම සම්බන්ධ කාර්යයන්, විස්කෝතු සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය පැටවීම, බෑම සහ ගෙනයාම සම්බන්ධ කාර්යයන්, පිටි හැලීම සම්බන්ධ කාර්යයන්, මිශ්‍ර පදම් පිටි, භාජන කපන මේසයෙහි ඇතිරීම, දිගහැරීම හා තුනී කිරීම, විස්කෝතු ටින් හා පැකට් ගෙනයෑම, අට්ටි ගැසීම, පැටවීම සහ බෑම ආදී කටයුතු සම්බන්ධ කාර්යයන්, පැකට්වල ඇහිරීම, තාප මුද්‍රාතැබීම, කුඩා පෙට්ටිවල ඇහිරීම සහ කුඩා පෙට්ටි ඇලවීම

*(ආ) රසකැවිලි සෑදීම :*

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ :-*

ග්ලූකෝස්, සීනි සාර වර්ග, කොකෝ ඇට, මිල්ක් පවුඩර්, එළවළු, බටර්, ජෙලටින්, රසායන ද්‍රව්‍ය හා රස වර්ග ඇතුළු අවශ්‍ය ද්‍රව්‍යයන් බාරගැනීම සහ ගබඩා කිරීම සම්බන්ධ කාර්යයන්, අවශ්‍ය ද්‍රව්‍යයන් කිරා බැලීම, මැනීම සහ මිශ්‍ර කිරීම, ටොපි සම්බන්ධ කාර්යයන්, අවශ්‍ය ද්‍රව්‍යයන් කිරා බැලීම, මැනීම සහ මිශ්‍ර කිරීම, ටොපි, චොක්ලට් හා රසකැවිලි කිරා බැලීම සහ ඇහිරීම, බන්දේසිවල රසකැවිලි එකතු කිරීම හා රසකැවිලි තාප කරන කාමරයේ දී රසකැවිලි එකතු කිරීම හා රසකැවිලි තාප කරන කාමරයේ දී වේලීම, ජෙලටින් හා පාට වර්ග යෙදීම, ජුජුබ්ස් බන්දේසිවල එකතු කිරීම, කිරා බැලීම සහ ඇහිරීම, රසකැවිලි සහ චොක්ලට් එතීම, ලේබල් ගැසීම සහ ඇහිරීම සහ රසකැවිලි සෑදීමට අදාල වැඩවලට සම්බන්ධ වූ හෝ ඊට අනුසාංගික වූ වෙනත් කාර්යයන්

*“සී” ශ්‍රේණියේ කම්කරුවෝ (නුපුහුණු)*

*(අ) විස්කෝතු සෑදීම :*

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ :-*

පදම් වූ පිටි කැට කුඩු කිරීම සම්බන්ධ කාර්යයන්, පිච්චූ විස්කෝතු නිවීමේ රාක්කයෙන් එහා මෙහා ගෙනයාම, තැටි සහ භාජන සේදීම සහ පිරිසිදු කිරීම, කැපූ විස්කෝතු එකතු කිරීම සහ පිළියෙල කිරීම සහ විස්කෝතු සෑදීමට අදාල වැඩවලට සම්බන්ධ හෝ ඊට අනුශාංගික වූ වෙනත් කාර්යයන්

*(ආ) රස කැවිලි සෑදීම :*

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ :-*

රසකැවිලි, චොක්ලට් සහ ටොපි තේරීම, බෑග් මුද්‍රා තැබීම, චොකලට් අච්චු පිරවීම, අච්චුවලින් චොකලට් ගැලවීම.

1 වගුව

**අවම මාසික වේතන ප්‍රමාණය**

යන්ත්‍රානුසාරයෙන් වැඩ කරන කර්මාන්ත ශාලාවක් වූ විට

| කම්කරුවාගේ පන්තිය | 1 සේවා වසර රු. ශ. | 2 සේවා වසර රු. ශ. | 3 සේවා වසර රු. ශ. | 4 සේවා වසර රු. ශ. | 5 සේවා වසර රු. ශ. |
|---|---|---|---|---|---|
| "ඒ " ශ්‍රේණියේ කම්කරුවෝ (පුහුණු) | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 10,962 00 | 11,112 00 | 11,262 00 | 11,412 00 | 11,562 00 |
| (ආ) රසකැවිලි සෑදීම | 10,962 00 | 11,112 00 | 11,262 00 | 11,412 00 | 11,562 00 |
| "බී" ශ්‍රේණියේ කම්කරුවෝ (අර්ධ පුහුණු) | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 10,542 00 | 10,667 00 | 10,792 00 | 10,917 00 | 11,042 00 |
| (ආ) රසකැවිලි සෑදීම | 10,542 00 | 10,667 00 | 10,792 00 | 10,917 00 | 11,042 00 |
| "සී" ශ්‍රේණියේ කම්කරුවෝ (නුපුහුණු) | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 10,122 00 | 10,222 00 | 10,322 00 | 10,422 00 | 10,522 00 |
| (ආ) රසකැවිලි සෑදීම | 10,122 00 | 10,222 00 | 10,322 00 | 10,422 00 | 10,522 00 |

II වගුව

**අවම මාසික වේතන ප්‍රමාණය**

අතින් වැඩ කරන කර්මාන්ත ශාලාවක් වූ විට

| කම්කරුවාගේ පන්තිය | 1 සේවා වසර රු. ශ. | 2 සේවා වසර රු. ශ. | 3 සේවා වසර රු. ශ. | 4 සේවා වසර රු. ශ. | 5 සේවා වසර රු. ශ. |
|---|---|---|---|---|---|
| "ඒ " ශ්‍රේණියේ කම්කරුවෝ (පුහුණු) | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 10,500 00 | 10,650 00 | 10,800 00 | 10,950 00 | 11,100 00 |
| (ආ) රසකැවිලි සෑදීම | 10,500 00 | 10,650 00 | 10,800 00 | 10,950 00 | 11,100 00 |
| "බී" ශ්‍රේණියේ කම්කරුවෝ (අර්ධ පුහුණු) | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 10,080 00 | 10,205 00 | 10,330 00 | 10,455 00 | 10,580 00 |
| (ආ) රසකැවිලි සෑදීම | 10,080 00 | 10,205 00 | 10,330 00 | 10,455 00 | 10,580 00 |
| "සී" ශ්‍රේණියේ කම්කරුවෝ (නුපුහුණු) | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 9,660 00 | 9,760 00 | 9,860 0 | 9,960 00 | 10,060 00 |
| (ආ) රසකැවිලි සෑදීම | 9,660 00 | 9,760 00 | 9,860 0 | 9,960 00 | 10,060 00 |

01 - 65/7

**පඩිපාලක සභා ආඥාපනත**

ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරනු ලදුව, මෙහි පහත උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ආමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013 ජනවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1966 මාර්තු මස 25 වැනි දින අංක 14688 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනයේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන්වරට 2010 අගෝස්තු මස 27 වැනි දින අංක 1668/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූද, උපලේඛනයේ හි II වැනි කොටස වෙනුවට පහත සඳහන් නව කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය :–

*II වැනි කොටස*

*මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය*

***කම්කරුවන්ගේ පන්තිය***

*I (අ) වැනි ශ්‍රේණිය* :
මෝස්තරකරුවෝ හෝ ඩිසයිනර්වරු, ඇඳුම් මසන්නෝ, ඩිසයින් පන්ච් කරන්නෝ, ඩිස්කට් සකසන්නෝ

*(ආ) වැනි ශ්‍රේණිය* :
ප්‍රධානීන් නොහොත් අංශ පරිපාලකවරු

*II වැනි ශ්‍රේණිය* :
ඇඳුම් කපන්නෝ (අතින්) ඇඳුම් කපන්නෝ, යන්ත්‍ර අළුත් වැඩියා කරන්නෝ, අවසාන වරට හරි වැරදි බලන්නෝ

*III වැනි ශ්‍රේණිය* :
හරි වැරදි බලන්නෝ සහ තෝරන්නෝ, රෙදි මදින කම්කරුවෝ, විවිධ වැඩ කරන (ගැහැණු) කම්කරුවෝ, මුද්‍රා තබන (ගැහැණු) කම්කරුවෝ, රෙදි මදින්නෝ (ගැහැණු) මහන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ, විදුලි බලයෙන් රෙදි මදින යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ, නිකුත් කරන (ගැහැණු) කම්කරුවෝ, මැෂින්/අතින් එම්බ්‍රොයිඩර් කරන්නෝ

*IV වැනි ශ්‍රේණිය* :
රෙදි අතුරන්නෝ (පිරිමි), රෙදි අතුරන්නෝ (ගැහැණු), අසුරන්නෝ, සෙලෝපේන් මලු හා කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, නුපුහුණු කම්කරුවෝ, ගබඩා කම්කරුවෝ

*V වැනි ශ්‍රේණිය* :
ආධුනිකයන් හා පුහුණුවන්නන්
ඉහත සඳහන් යම් වෘත්තිය ආධුනිකයකුගේ හෝ පුහුණුවන්නකුගේ ආධුනික කාලය වැඩ කරන දින 156 කින් යුක්ත විය යුතු ය.

**වේතන ප්‍රමාණය**

| *සේවා වර්ෂය* | *I(අ) ශ්‍රේණිය* | *I(ආ) ශ්‍රේණිය* | *II ශ්‍රේණිය* | *III ශ්‍රේණිය* | *IV ශ්‍රේණිය* | *V ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 1 සේවා වර්ෂය | 10,530 00 | 10,140 00 | 9,125 00 | 9,075 00 | 8,625 00 | 5,700 00 |
| 2 සේවා වර්ෂය | 10,730 00 | 10,315 00 | 9,275 00 | 9,200 00 | 8,725 00 | |
| 3 සේවා වර්ෂය | 10,930 00 | 10,490 00 | 9,425 00 | 9,325 00 | 8,825 00 | |
| 4 සේවා වර්ෂය | 11,130 00 | 10,665 00 | 9,575 00 | 9,450 00 | 8,925 00 | |
| 5 සේවා වර්ෂය | 11,330 00 | 10,840 00 | 9,725 00 | 9,575 00 | 9,025 00 | |

01 - 65/8

---

**පඩිපාලක සභා ආඥාපනත**

ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ, ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013 ජනවාරි මස 01 වැනි දින වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05.
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1950 අගෝස්තු මස 25 වැනි දින අංක 10141 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයෙහි වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන්වරට 2010 ජූනි මස 30 වන දින අංක 1660/35 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරනු ලැබූ තීරණ එම උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*II වන කොටස*

*කාල මිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණය*

I වැනි තීරයෙහි නිශ්චිතව සඳහන් සේවකයින්ට සාමාන්‍ය වැඩ කරන දිනයක් සඳහා කාල මිම්මේ වැඩ වෙනුවෙන් ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය II වැනි තීරයෙහි දක්වා ඇති ප්‍රමාණයන් විය යුතු ය.

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *සේවකයින්ගේ පන්තිය* | *ප්‍රමාණය*<br>*රු. ශත* |
| **නුපුහුණු** | 455.00 |
| **පුහුණු** | |
| පින්තාරුකරුවෝ, සැරසිලිකරුවෝ, උළු සෙවිලි කරන්නෝ (වහල), පලංචිකරුවෝ, යාන්ත්‍රික උපකරණ ක්‍රියා කරවන්නෝ, කංකානම්වරු, මේසන්වරු (ගොඩනැගිලි), වඩුවෝ (ගොඩනැගිලි), ජලනල කාර්මිකයෝ, ඉදිකරන්නෝ (නිර්මානක වානේ), උපකරණ නඩත්තු කරන්නෝ, බෙලෙක් වැඩකරුවෝ | 532.00 |

අවම මාසික වේතන ප්‍රමාණය

ඉහත I වන තීරයෙහි නිශ්චිතව දක්වා ඇති සේවකයින්ට ගෙවිය යුතු අවම මාසික වේතන ප්‍රමාණය පහත වගුවෙන් දක්වා ඇත :-

| *සේවක පන්තිය* | *1 වැනි වසර*<br>*රු. ශ.* | *2 වැනි වසර*<br>*රු. ශ.* | *3 වැනි වසර*<br>*රු. ශ.* | *4 වැනි වසර*<br>*රු. ශ.* | *5 වැනි වසර*<br>*රු. ශ.* |
|---|---|---|---|---|---|
| නුපුහුණු | 11,375 00 | 11,475 00 | 11,575 00 | 11,675 00 | 11,775.00 |
| පුහුණු | 13,300 00 | 13,475 00 | 13,650 00 | 13,825 00 | 14,000 00 |

01 - 65/9

---

**පඩිපාලක සභා ආඥාපනත**

පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 09 වැනි වගන්තිය යටතේ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් වෙත පවරන ලද බලය ප්‍රකාරව පහත නම් සඳහන් තැනැත්තන් පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් වශයෙන් 2012 දෙසැම්බර් මස 01 වැනි දින සිට අවුරුදු 03ක කාලයක් සඳහා ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් පත්කළ බව 1971.06.04 වැනි දිනැති අංක 14961 දරන *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි අංක 30 යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු මහලේකම් කාර්යාලයේ දී ය.

**නම නියම කොට පත්කළ සාමාජිකයින්**

01. ඕ. ජී. පෙරේරා මයා
02. එම්. විමලසේන මයා
03. ආරියදාස හේවාමාලගේ මයා

**සේව්‍ය නියෝජිත සාමාජිකයින්**

01. ප්‍රසාද් ද සිල්වා මයා
02. ඩබ්. එම්. වයි. විජේවර්ධන මිය
03. ජී. කේ විතානගේ මයා
04. මානෙල් වනිගසූරිය මිය
05. ඩී. ජේ. එම්. ඩී. ජේ. උදයකුමාර මයා
06. සුමිත් නිශාන්ත රුකුනායක මයා
07. ජෙහාන් ප්‍රනාන්දු මයා
08. පී. කේ. ඩී. ජී. සී. මිලින්ද අල්විස් මයා

**සේවක නියෝජිත සාමාජිකයින්**

01. පී. ජේ. ඒ. පෙරේරා මයා
02. කේ. ඉලංගකෝන් මයා
03. ඩබ්. කේ. පියරත්න මයා
04. බී. එන්. එස්. ජේ. කරුණාරත්න මයා
05. පී. හෙට්ටිආරච්චි මයා
06. ජී. එම්. එස්. පී. ද එස්. සූරියවංශ මයා
07. ජීවරත්න වෙත්තසිංහ මයා
08. යූ. සී. පෙරේරා මයා

01 - 65/10

---

**පඩිපාලක සභා ආඥාපනත**

හෝටල් සහ භෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ හෝටල් සහ භෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, මෙම උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන තීරණ, කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 අප්‍රේල් මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

2 - G 17037

**උපලේඛනය**

හෝටල් සහ හෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1979 අප්‍රේල් මස 27 වැනි දින අංක 34 දරන ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ නිවේදනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන්වරට 2012 ජනවාරි මස 03 වැනි දින අංක 1739/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙන් පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ ද, තීරණ පහත සඳහන් පරිදි තවදුරටත් වෙනස් කළ යුතු ය.

හෝටල් සහ හෝජන සැපයීමේ කර්මාන්තයෙහි නියුක්ත පහත දැක්වෙන පන්ති වලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ වන අවම මාසික වේතන ප්‍රමාණය පහත I වගුවේ දැක්වෙන පරිදි විය යුතු ය.

*I වැනි ශ්‍රේණිය*

ඇසිස්ටන් රූම්බෝයි, ක්ලෝක් රූම් බෝයි ඇටෙන්ඩන්ට්, ක්ලොක්රූම් නැනී, කම්කරු - නිදන කාමරවල ක්ලීනර්ස්,ලවුන්ජ් ලේබර්ස්, කසල ශෝධක (නිදන කාමර ), කසල ශෝධක කම්කරු, ඔෆිස් බෝයි, කාර්යාල කම්කරු, කම්කරු - ගබඩා සයිකල් ඔඩ්ලි, මුළුතැන්ගෙයි පිරිසිදු කරන්නා මුළුතැන්ගෙයි සහායක, පිඟන් සෝදන්නා කම්කරු මුළුතැන්ගෙයි, පෝටර්, පැන්ට්‍රිබෝයි, උදව්කරු, ප්ලේට් රූම්බෝයි, ග්ලාස් රූම්බෝයි, සිල්වර් රූම්බෝයි, බාර් ලේබර්ස්, යුටිලිටි වර්කර්ස්, වතුකම්කරු/උදව්කරු, නුපුහුණු කම්කරු (නඩත්තු)

*II වැනි ශ්‍රේණිය*

රූම් බෝයි, හවුස්මන්, රූම්මේඩ්, ලිනන් රූම් ඇටෙන්ඩන්ට්, රූම් නැනී, පියන්වරු, මැසෙන්ජර්, චෙකර්වරු, බෙල්බෝයි, පේජ්බෝයි, සෝපානකරු, ඩෝමන්, බැගේජ්ලිෆ්ට් ඔපරේටර්වරු, පාස් ලිෆ්ට් ඔපරේටර්, සහකාර වේටර්, සහකාර ස්ටුවර්ඩ්, බස්බෝයි, බාර්ටෙන්ඩර් සහකරු, සහකාර බාර්මන්, බිලියඩ් මාර්කර්, ලයිෆ් ගාඩ්, ලොන්ඩරි ඇසිස්ටන්, ගාඩ්නර්, ෆුල් ඇටෙන්ඩන්ට්, අර්ධ පුහුණු කම්කරු (නඩත්තු )

*III වැනි ශ්‍රේණිය*

සිම්ස්ට්‍රස් ටේලර්, සම්බාහකයෝ, ලිපිකරු III වන ශ්‍රේණිය, ගබඩා සහායක, රියදුරුවරු, බාර්කැෂියර්, බිල් ලිපිකරු, සාමාන්‍ය ලිපිකරු, පෞද්ගලික ලිපිකරු, ස්නැක් බාර්, අරක්කැමි, රසකැවිලි සාදන්නෝ, සහකාර අරක්කැමි, තර්ඩ් කිචන් කොමිස්, සහකාර බක්කරේ, පැන්ට්‍රිමන්, අරක්කැමි III වන ශ්‍රේණිය, ඇසිස්ටන් බෙල් කැප්ටන්, හෝල් පෝටර්, වේටර්, බාර්මන්, ස්ටුවර්ඩ්, බාර් වේටර්, බාර් ස්ටුවර්ඩ්, සිකියුරිටි ගාඩ්, උද්‍යාන පාලක, පුහුණු ( නඩත්තු ) කම්කරු, බාර්ටෙන්ඩර්

*IV වන ශ්‍රේණිය*

හෙල්ත් ක්ලබ්, පිළිගැනීමේ නිලධාරී, ලිපිකරු II ශ්‍රේණිය, සහකාර ගබඩාකරු, ගබඩා ලිපිකරු, ඇසිස්ටන්ට් නයිට් ඔඩිටර්, ටයිම් කීපර්, කාඩෙක්ස් ඇසිස්ටන්වරු, ගිණුම් ලිපිකරු, සහකාර පොත් තබන්නා,කොස්ට් ක්ලාක්, ක්‍රෙඩිට් ක්ලාක්, විකුණුම් ලෙජර් ලිපිකරු, වැටුප් ලිපිකරු, යතුරු ලියන්නා, මුදල් අදියුරු, ජෙනරල් ඇසිස්ටන් පෞද්ගලික සහායක, සහකාර ප්‍රධාන අරක්කැමි, සෙකන්ඩ් කිචන් කොමිස්, බක්කරේ, අංශ ප්‍රධාන අරක්කැමි, II පන්තියේ අරක්කැමි, දුරකථන ක්‍රියාකරු, පිළිගැනීමේ නිලධාරී, බෙල් කැප්ටන්, ප්‍රධාන පෝටර්, රූම් සර්විස්, ඕඩර් ටේකර්, බට්ලර්වරු, හෙඩ් බාර්මන්, හෙඩ් බාර් කීපර්, හෙඩ් වේටර්, හෙඩ් ස්ටුවර්ඩ්, කැප්ටන් හොස්ටේස්, හෙඩ් පැන්ට්‍රිමන්, ටී මේකර්, සිකියුරිටි ලීඩර්, සිනියර් ලොන්ඩරි ඇසිස්ටන්

*V වැනි ශ්‍රේණිය*

ෆ්ලෝ සුපර්වයිසර්වරු, ලිනන්රූම් සුපර්වයිසර්වරු, හෙදි, ඇසිස්ටන් හවුස් කීපර්, ලිපිකරු I ශ්‍රේණිය, ගබඩා භාරකරු, ප්‍රධාන ලිපිකරු, සරප්, පොත් තබන්නා, නයිට් ඔඩිටර්, ආදායම් ගණන් පරීක්ෂක, ලඝුලේඛක, ප්‍රධාන ලිපිකරු, ප්‍රධාන අයකැමි, ගණන් පරීක්ෂක, සහකාර මිළදී ගැනීමේ නිලධාරී, චිෆ් ටයිම් කීපර්, කිචන් ස්ටුවර්ඩ් සුපර්වයිසර්, ෆස්ට් කිචන් කොමිස්, ප්‍රධාන අරක්කැමි, මණ්ඩලීය අරක්කැමි, රෙස්ටුරන්ට් අරක්කැමි, ෆ්‍රන්ට් ඔෆීස් ක්ලාක්, ගුවන් තොටුපල නියෝජිත, ප්‍රධාන පිළිගැනීමේ නිලධාරී, ප්‍රධාන ටෙලෙක්ස් ක්‍රියාකරු, ප්‍රධාන දුරකථන ක්‍රියාකරු, රිසවේෂන් ක්ලාක්, පරිපාලක ඩිස්ක්ජෝකි, කළමනාකරු, සිකියුරිටි ෆස්ට් ලීඩර්, උද්‍යාන පරිපාලක,ඉංජිනේරු චාජ්හෑන්ඩ්, පිහිනුම් තටාක පරිපාලක

I වගුව

වැඩ කරන මාසයක් සඳහා වූ අවම වේතන ප්‍රමාණය

| | සේවක පන්තිය | | | | |
|---|---|---|---|---|---|
| *සේවා වසර* | *ශ්‍රේණිය I රු. ශත.* | *ශ්‍රේණිය II රු. ශත.* | *ශ්‍රේණිය III රු. ශත.* | *ශ්‍රේණිය IV රු. ශත.* | *ශ්‍රේණිය V රු. ශත.* |
| 1 වසර | 9,660 00 | 10,080 00 | 10,500 00 | 10,920 00 | 11,340 00 |
| 2 වසර | 9,760 00 | 10,205 00 | 10,650 00 | 11,095 00 | 11,540 00 |
| 3 වසර | 9,860 00 | 10,330 00 | 10,800 00 | 11,270 00 | 11,740 00 |
| 4 වසර | 9,960 00 | 10,455 00 | 10,950 00 | 11,445 00 | 11,940 00 |
| 5 වසර | 10,060 00 | 10,580 00 | 11,100 00 | 11,620 00 | 12,140 00 |
| 6 වසර | 10,160 00 | 10,705 00 | 11,250 00 | 11,795 00 | 12,340 00 |
| 7 වසර | 10,260 00 | 10,830 00 | 11,400 00 | 11,970 00 | 12,540 00 |
| 8 වසර | 10,360 00 | 10,955 00 | 11,550 00 | 12,145 00 | 12,740 00 |
| 9 වසර | 10,460 00 | 11,080 00 | 11,700 00 | 12,320 00 | 12,940 00 |
| 10 වසර | 10,560 00 | 11,205 00 | 11,850 00 | 12,495 00 | 13,140 00 |

01 - 65/11

---

**පඩිපාලක සභා ආඥාපනත**

නැව් තටාක තොටුපලවල් හා වරායන්හි ප්‍රවාහන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

නැව් තටාක තොටුපලවල් හා වරායන්හි ප්‍රවාහන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සේවක නියෝජිත සාමාජිකයකු වශයෙන් සිටි උපුල් ප්‍රියශාන්ත මහතා සහ සේව්‍ය නියෝජිතයකු වන ඩබ්. පී. කේ. වීරවර්ධන මහතා වෙනුවට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වැනි වගන්තිය යටතේ ගරු කම්කරු සහ කම්කරු සබඳතා ඇමතිතුමා විසින් සේවක නියෝජිත රණසිංහ ආරච්චිගේ දොන් ජයතිලක මහතා සහ සේව්‍ය නියෝජිත ක්‍රිස් වීරසිංහ මහතා පත්කළ බව එකී ආඥාපනතේ 30 වැනි නියෝග යටතේ නිවේදනය කරනු ලැබේ. මෙම පත් කිරීම 2013.08.14 දක්වා වූ කාලය සඳහා පමණි.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

01-65/12

**පඩිපාලක සභා ආඥාපනත**

තේ පිටරට යැවීමේ කර්මාන්තය

(136 වැනි අධිකාරය ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද තීරණ කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 ජනවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

***උපලේඛනය***

තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1945ක් වූ ජූලි මස 21 වැනි දින අංක 9436 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කලට වෙනස් කරන ලද්දාවූ ද, අවසන්වරට 2010 ජූනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම්වලින් වෙනස් කරන ලද්දාවූ ද තීරණ එම උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් සංශෝධනය කළ යුතුය.

***II වැනි කොටස***

සේවකයාගේ පන්තිය

*II වැනි ශ්‍රේණිය :*

සැම්පල් පිළියෙල කිරීම, පෙට්ටිවල පියන් හැර එහි ඇතුළත දේ පිටට හැලීම, හිස් පෙට්ටිවල බර කිරීම, පැක් කිරීම, කඩදාසි හා ඊයම් කොළ කැපීම, පෝරු දැමීම, පෙට්ටිවල තේ ඇහිරීම, එළියේ තැබීම, උඩ පැත්ත පෝරු කිරීම හා ගිනි වතුරෙන් පෑස්සීම, පියන් දැමීම හා ඇන ගැසීම , වලයන් දැමීම හා කම්බි දැමීම, පරණ සලකුණ සූරා දැමීම, ලකුණු කිරීම හා අච්චුවෙන් අකුරු දැමීම, ඊයම් පැකට් සෑදීම හා ගිනි වතුරෙන් පෑස්සීම, පැකට්ටු සෑදීම, බර කිරීම, පැකට්ටු කිරීම, ලේබල් ඇලවීම, ජුටේසින් කවර කැපීම හා සෑදීම, ජුටේසින් වලින් එතීම, ස්ටෝරු හා කාණු ශුද්ධ කිරීම හා පිස දැමීම, කැපීම හා ඇවිස්සීම හා නැවත ගින්නෙන් රත් කිරීම, අමු තේ පාට කිරීම යන මේවායේ නිරත සේවකයෝ

*මධ්‍යම ශ්‍රේණිය :*

තේ පුරවා පෙට්ටි කිරීම, අතින් බල්ක් කිරීම, අතින් කලවම් කිරීම යන මේවායේ නිරත සේවකයෝ, පෙට්ටි සාදන්නන් හා අලුත්වැඩියා කරන්නන්

*I වැනි ශ්‍රේණිය :*

පෙට්ටි බෑම හා ගෙන යාම, අඩුක් කිරීම, කළවම් කරන තැනට පෙට්ටි ගෙන යාම, ස්ටෝරුවට ගෙන ගොස් නැවත අඩුක් කිරීම, පෙට්ටි එළියේ දැමීම, නැවට යැවීමට පැටවීම යන මේවාගේ නිරත සේවකයෝ

මුරකරුවන්

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| සේවා වසර | 11 ශ්‍රේණිය රු. ශ. | මධ්‍යම ප්‍රමාණය රු. ශ. | 1 ශ්‍රේණිය රු. ශ. | මුරකරුවන් රු. ශ. |
|---|---|---|---|---|
| 1 වසර | 9,660 00 | 10,080 00 | 10,500 00 | 9,660 00 |
| 2 වසර | 9,760 00 | 10,205 00 | 10,650 00 | 9,760 00 |
| 3 වසර | 9,860 00 | 10,330 00 | 10,800 00 | 9,860 00 |
| 4 වසර | 9,960 00 | 10,455 00 | 10,950 00 | 9,960 00 |
| 5 වසර | 10,060 00 | 10,580 00 | 11,100 00 | 10,060 00 |
| 6 වසර | 10,160 00 | 10,705 00 | 11,250 00 | 10,160 00 |
| 7 වසර | 10,260 00 | 10,830 00 | 11,400 00 | 10,260 00 |
| 8 වසර | 10,360 00 | 10,955 00 | 11,550 00 | 10,360 00 |
| 9 වසර | 10,460 00 | 11,080 00 | 11,700 00 | 10,460 00 |
| 10 වසර | 10,560 00 | 11,205 00 | 11,850 00 | 10,560 00 |
| 11 වසර | 10,660 00 | 11,330 00 | 12,000 00 | 10,660 00 |
| 12 වසර | 10,760 00 | 11,455 00 | 12,150 00 | 10,760 00 |
| 13 වසර | 10,860 00 | 11,580 00 | 12,300 00 | 10,860 00 |
| 14 වසර | 10,960 00 | 11,705 00 | 12,450 00 | 10,960 00 |
| 15 වසර | 11,060 00 | 11,830 00 | 12,600 00 | 11,060 00 |
| 16 වසර | 11,160 00 | 11,955 00 | 12,750 00 | 11,160 00 |
| 17 වසර | 11,260 00 | 12,080 00 | 12,900 00 | 11,260 00 |
| 18 වසර | 11,360 00 | 12,205 00 | 13,050 00 | 11,360 00 |
| 19 වසර | 11,460 00 | 12,330 00 | 13,200 00 | 11,460 00 |
| 20 වසර | 11,560 00 | 12,455 00 | 13,350 00 | 11,560 00 |
| 21 වසර | 11,660 00 | 12,580 00 | 13,500 00 | 11,660 00 |
| 22 වසර | 11,760 00 | 12,705 00 | 13,650 00 | 11,760 00 |
| 23 වසර | 11,860 00 | 12,830 00 | 13,800 00 | 11,860 00 |
| 24 වසර | 11,960 00 | 12,955 00 | 13,950 00 | 11,960 00 |
| 25 වසර | 12,060 00 | 13,080 00 | 14,100 00 | 12,060 00 |
| 26 වසර | 12,160 00 | 13,205 00 | 14,250 00 | 12,160 00 |

01 - 65/13

---

**පඩිපාලක සභා ආඥාපනත**

පොල් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වන වගන්තිය යටතේ පොල් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තීරණ, ගරු කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013 ජනවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

පොල් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1949 අප්‍රේල් මස 30 වන දින අංක 9971 දරන *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූවාවූ නිවේදනයෙහි වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට 2010 අගෝස්තු මස 27 වැනි දින අංක 1668/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයෙහි II හා III වන කොටස් වෙනුවට පහත සඳහන් කොටස් ආදේශ කිරීමෙන් වෙනස් කළ යුතු ය.

*II වන කොටස*

ආඥාපනතේ 06 වන වගන්තිය යටතේ වූ නිවේදනයේ විස්තර කළ පොල් නිපදවීමේ කර්මාන්තයේ කටයුතුවල ඇතැම් කාර්යයන් සම්බන්ධයෙන් කෑලි මිම්මේ වැඩ සඳහා වලංගු වූ අවම වේතන ප්‍රමාණයන් මෙසේ ය.

| *කාර්යය* | *ප්‍රමාණය* | *රු. ශත* |
|---|---|---|
| ***වේලාපු පොල් නිපදවීමේදී*** | | |
| පොල් ලෙලි ගැසීම | ගෙඩි 1000 | 400.00 |
| කටු ගැලවීම | ගෙඩි 1000 | 278.00 |
| කුරුටු ගෑම | ගෙඩි 1000 | 278.00 |
| පොල් මද සේදීම හා කඩ කිරීම | රාත්තල් 1000 | 242.00 |
| වේලීම (ඩ්‍රයරයෙන් ) | රාත්තල් 1000 | 190.00 |
| වේලීම (ඩෙසිකේටරයෙන්) | රාත්තල් 1000 | 255.00 |
| හැලීම සහ ශ්‍රේණි කිරීම | රාත්තල් 1000 | 215.00 |
| ඇහිරීම සහ තහඩු අකුරු ගැසීම | රාත්තල් 120 - 130 බෑගයක් | 17.00 |

*ගම්බද කර්මාන්තයක් වශයෙන් හැරෙන්නට කෙඳි සහ කොහු නිෂ්පාදන තැනීමේ දී :*

| | |
|---|---|
| ලෙලි තැලීම (ඇට කෙඳි කොහු ) තෙත පිටින් බර - හොන්ඩරයකට | 175.00 |
| ලෙලි කැඩීම හා (ශුද්ධ කිරීම ) තෙත පිටින් බර - හොන්ඩරයකට | 175.00 |
| ගුදිරි කොහු ශුද්ධ කිරීම,වේලීම සහ මිටි බැඳීම - හොන්ඩරයකට | 150.00 |
| ඇට කෙඳි කොහු කැරලි කිරීම සහ බැඳීම - හොන්ඩරයකට | 142.00 |

***පැදුරු සහ කළාල තැනීම :***

| | | |
|---|---|---|
| පැදුරු වර්ග | - අඩියකට | 172.00 |
| කළාල වර්ග | - යාරයකට | 156.00 |
| ඇට කෙඳි කොහු පීරීම සහ බැඳීම | - හොණ්ඩරයකට | 465.00 |

*III වන කොටස*

*කාල මිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණයන්*

මෙහි I වන තීරයෙහි නිශ්චිතව සඳහන් කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා සාමාන්‍ය වැඩ කරන දිනයකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය II වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති ප්‍රමාණයෙන් විය යුතු ය.

| | *I වන තීරය සේවකයාගේ පන්තිය* | *II වන තීරය ප්‍රමාණය රු. ශත* |
|---|---|---|
| 1. කපාපු පොල් නිෂ්පාදනය | කංකානමට | 440.00 |
| 2. පොල් තෙල් නිෂ්පාදනය | කම්කරුවෙකුට (ස්ත්‍රී/පුරුෂ ) | 425.00 |
| 3. කොහු හා කොහු නිෂ්පාදන | කම්කරුවෙකුට (ස්ත්‍රී/පුරුෂ ) | 370.00 |
| 4. කොහු හා කොහු නිෂ්පාදන | කංකානමට | 370.00 |

01 - 65/14

**පඩිපාලක සභා ආඥාපනත**

ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් තීරණය කරනු ලදුව, මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් තීරණ ගරු කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013 ජනවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව 1978 අගෝස්තු මස 11 වැනි දින අංක 330 දරන *ගැසට්* පත්‍රයේ පළ කරන ලද උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද සහ අවසන් වරට 2010 ජූලි මස 30 වැනි දින අංක 1664/24 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙන් වෙනස් කරන ලද්දා වූ තීරණවල II වැනි කොටස වෙනුවට පහත සඳහන් ඡේදයන් ආදේශ කිරීමෙන් එම උපලේඛනය තවදුරටත් වෙනස් කළ යුතු ය :-

*(අ)* ක්‍රියාකාරී සේවාවන් .- ආරක්ෂක නිලධාරීන්, ආරක්ෂක භටයන්, මුරකරුවන්, පැට්රෝල්මන් හෝ කිනම් නමින් හැඳින්වුවද ක්‍රියාකාරී සේවාවන්හි යෙදෙන සේවකයින්.

*(ආ)* පාලනමය සේවාවන් .- ක්‍රියාකාරී සේවාවන්හි පාලනයෙහි නියුක්ත සේවකයන්, කාර්ය භාර නිලධාරීන්, මුර සේවා භාර සුපවයිසර්වරු හෝ සුපවයිසර්වරු.

ඉහතින් දක්වා ඇති සේවකයින්ට ගෙවිය යුතු කාලම්මීමේ මාසික අවම වේතන මෙසේ ය :

**අවම මාසික වේතනය**

| *සේවා වසර* | *ක්‍රියාකාරී සේවාවන්* <br> *රු. ශ.* | *පාලනමය සේවාවන්* <br> *රු. ශ.* |
|---|---|---|
| 1 වසර | 8,820 00 | 9,440 00 |
| 2 වසර | 8,920 00 | 9,590 00 |
| 3 වසර | 9,020 00 | 9,740 00 |
| 4 වසර | 9,120 00 | 9,890 00 |
| 5 වසර | 9,220 00 | 10,040 00 |
| 6 වසර | 9,320 00 | 10,190 00 |
| 7 වසර | 9,420 00 | 10,340 00 |
| 8 වසර | 9,520 00 | 10,490 00 |
| 9 වසර | 9,620 00 | 10,640 00 |
| 10 වසර | 9,720 00 | 10,790 00 |
| 11 වසර | 9,820 00 | 10,940 00 |
| 12 වසර | 9,920 00 | 11,090 00 |

අවම මාසික වේතනය (සම්බන්ධිතයි)

| සේවා වසර | ක්‍රියාකාරී සේවාවන් රු. ශ. | පාලනමය සේවාවන් රු. ශ. |
|---|---|---|
| 13 වසර | 10,020 00 | 11,240 00 |
| 14 වසර | 10,120 00 | 11,390 00 |
| 15 වසර | 10,220 00 | 11,540 00 |
| 16 වසර | 10,320 00 | 11,690 00 |
| 17 වසර | 10,420 00 | 11,840 00 |
| 18 වසර | 10,520 00 | 11,990 00 |
| 19 වසර | 10,620 00 | 12,140 00 |
| 20 වසර | 10,720 00 | 12,290 00 |
| 21 වසර | 10,820 00 | 12,440 00 |
| 22 වසර | 10,920 00 | 12,590 00 |
| 23 වසර | 11,020 00 | 12,740 00 |
| 24 වසර | 11,120 00 | 12,890 00 |
| 25 වසර | 11,220 00 | 13,040 00 |
| 26 වසර | 11,320 00 | 13,190 00 |

01 -65/15

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.